// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2456/57 – 2025 ඔක්තෝබර් මස 02 වැනි බ්‍රහස්පතින්දා – 2025.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

2019 අප්‍රේල් මස 05 වැනි දින අංක 2117/58 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2019 අංක 72 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/VE/296.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
DIK/LAN/02/61.

2025 සැප්තැම්බර් මස 04 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**1 වන උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩපත්තුව සුළු කොට්ඨාසයේ, වැවුරුකන්නල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක MR/DKW/2017/588 හා 2018.11.26 දිනැති පැහැදිලි කිරීමේ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අක්ෂර **'A'** – *ගුලුගහවත්ත හෙවත් දන්ගහවත්ත* – **ප්‍රමාණය: හෙක්. 0.0071**

උතුරට: හේවා එඩේරගේ පියසේන හිමිකම් කියන දෙනියවත්ත සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට: කැබලි අක්ෂර B; දකුණට: මාර්ගය; බටහිරට: මාර්ගය.

02. කැබලි අක්ෂර **'B'** – *ගුලුගහවත්ත හෙවත් දන්ගහවත්ත* – **ප්‍රමාණය: හෙක්. 0.5583**

උතුරට: හේවා එඩේරගේ පියසේන හිමිකම් කියන දෙනියවත්ත; නැගෙනහිරට: සිරිමතී මුතුකුමාරණ හිමිකම් කියන දෙනියවත්ත; දකුණට: ඩබ්ලිව්. සෝමාවතී හිමිකම් කියන වෙරළුගහලන්ද, මාර්ගය සහ කැබලි අක්ෂර A; බටහිරට: කැබලි අක්ෂර A.

EOG 10 - 0032

1A – G 45492 – 09 (2025/10)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*